සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved


# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## අර්ධ වාර්ෂික පරීක්ෂණය - 2019

## 11 ශ්‍රේණිය
## චිත්‍ර කලාව - I

**නම/විභාග අංකය :-- ..................................................................................... කාලය : පැය 01 යි.**

- **සියලු ම ප්‍රශ්නවලට මෙම පත්‍රයේ ම පිළිතුරු සපයන්න.**
- **පහත සඳහන් ඡායාරූපය ඇසුරු කරගෙන අංක 1 සිට 5 තෙක් ප්‍රශ්නවලට නිවැරදි පිළිතුරු සපයන්න.**



(1) පොළොන්නරු යුගයේ හමුවන ලෝකඩ මූර්ති අතර සුවිශේෂී මූර්තියක් වන මෙමඟින් ...................................................... නිරූපණය කරයි.

(2) දැනට පොළොන්නරු කෞතුකාගාරයේ ප්‍රදර්ශනය කර ඇති මෙම ප්‍රතිමාව ............................................................... මාධ්‍යයෙන් නිර්මාණය කර ඇත.

(3) ප්‍රතිමාව නිර්මාණය සඳහා ............................................................. කිරීමේ ශිල්ප ක්‍රමය භාවිත කර ඇත.

(4) පද්මාසනයක් මත වැඩ සිටින අතර ............................................................. ඉරියව්වෙන් හිඳින ලෙස නිර්මාණය කර ඇත.

(5) මෙය ක්‍රි. ව. ............................................................. වන සියවසට අයත් හින්දු ආගමික නිර්මාණයකි.

- **ප්‍රශ්න අංක 06 සිට 10 තෙක් දී ඇති ප්‍රශ්නවලට නිවැරදි පිළිතුරු සපයන්න.**

(6) පැස්ටල් මාධ්‍යයෙන් වර්ණ ගැන්වූ සණිකවාදී ආභාසය සහිත සකුන්තලා නැමති සිතුවම නිර්මාණය කළ දමිල ජාතික ශිල්පියා කවුරුන් ද? .............................................................................

(7) සීගිරි කාන්තාවන්ගේ ඉනෙන් පහළ වළාකුළුවලින් වැසී ඇති නිසාත් අතින් මල් දරා ඇති නිසාත් ''අප්සරාවන්''යන මතය ප්‍රකාශ කළේ කවුරුන් ද? .............................................................................

(8) ඉන්දු නිම්න ශිෂ්ටාචාරයේ මොහෙන්ජොදාරෝ නගරයෙන් හමුවූ පූජක රුව නම් මූර්තිය නිමවා ඇති මාධ්‍ය කුමක් ද? .............................................................................

(9) බුදුන් වහන්සේ බුද්ධත්වය ලද බවට මිහිකත සාක්ෂි දරණ බව පෙන්වීම සඳහා මහනුවර යුගයේ කලාකරුවන් බහුලව යොදාගත් මුද්‍රාව නම් කරන්න. .............................................................................

(10) පාරාවරුන්ගේ තෙදබල පරාක්‍රමය මෙන්ම ආරක්ෂාව පිළිබඳ සංකල්පය නිරූපණය කෙරෙන කුඹු පිරමීඩය ඉදිරිපිට ඇති දූවන්ත මිසර ප්‍රතිමාව කුමක් ද? .............................................................................

| **ප්‍රශ්න අංක 11  15 තෙක් දී ඇති එක් එක් ප්‍රශ්නයට වඩාත් නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

11. පෝස්ටර් චිත්‍රයක් නිර්මාණයේ දී සැලකිය යුතු අත්‍යවශ්‍ය කරුණක් **නොවන්නේ,**
    (i) අක්ෂර භාවිතයෙන් පණිවිඩය තීව්‍ර කළ හැකි වීම.  (ii) සංකේතාත්මක සරල හැඩතල භාවිතය
    (iii) විවිධ ඉරියව් වලින් යුත් මානව රූප සංරචනය  (iv) පණිවිඩයේ වේගවත් බව හා මනා නිමාව

12. මූර්තියක් නෙළීමේ දී සිදුකරනු ලබන්නේ,
    (i) අනවශ්‍ය කොටස් කපා ඉවත්කර රූපය මතු කිරීමයි.
    (ii) අවශ්‍ය කොටස් එකතු කරමින් අනවශ්‍ය කොටස් ඉවත් කරමින් රූපයක් ගොඩනැගීමයි.
    (iii) අච්චුවක් මගින් පිටපත් ලබා ගැනීමය.
    (iv) ඉවත ලද විවිධ ද්‍රව්‍ය භාවිත කර යම්කිසි රූපයක් මතු කිරීමයි.

13. අවුකන බුදුපිළිමය ගැන කියවෙන නිවැරදි ප්‍රකාශය වන්නේ,
    (i) අධි උන්නත ආබද්ධ ප්‍රතිමාවකි.  (ii) අර්ධ උන්නත ආබද්ධ ප්‍රතිමාවකි.
    (iii) අධි උන්නත අනාබද්ධ ප්‍රතිමාවකි.  (iv) පූර්ණ උන්නත අනාබද්ධ ප්‍රතිමාවකි.

14. නිශ්චල ද්‍රව්‍ය බලා ඇඳීමකදී භාවිත කරන විෂය කරුණක් **නොවන්නේ,**
    (i) පරිමාණය හා පරිමාව  (ii) නිර්මාණාත්මක හැඩතල
    (iii) පර්යාවලෝකය  (iv) මතුපිට ස්වභාවය (වයනය)



15. ව්‍යාප්ත මෝස්තරයක් සඳහා වඩාත් සුදුසු මාතෘකාවක් වන්නේ,
    (i) මේස රෙද්දක් ඇඳ වර්ණ කිරීම  (ii) තෑගි දවටනයක් ඇඳ වර්ණ කිරීම
    (iii) ඔසරි පල්ලුවක් ඇඳ වර්ණ කිරීම  (iv) කුෂන් කවරයක් ඇඳ වර්ණ කිරීම

| **ප්‍රශ්න අංක 16 සිට 20 දක්වා දී ඇති රූපයට වඩාත් ගැළපෙන රූපය ඉදිරියේ ඇති A, B, C, D, E අක්ෂරයට අයත් රූප සටහන් ඇසුරින් තෝරා එයට අයත් ඉංග්‍රීසි අක්ෂරය වරහන් තුළ දක්වන්න.**

16.  (........................) **A** 

17.  (........................) **B** 

18.  (........................) **C** 

19.  (........................) **D** 

20.  (........................) **E** 

- **ප්‍රශ්න අංක 21 සිට 25 දක්වා ඇති ප්‍රශ්න සඳහා නිවැරදි පිළිතුරු යොදා හිස්තැන් පුරවන්න.**

21. ප්‍රංශයේ ලූවර් කෞතුකාගාරයේ ප්‍රදර්ශනය කර ඇති වීනස් ඩී මේලෝ ප්‍රතිමාව ............................................................ නම් ශිල්පියා විසින් නිර්මාණය කර ඇති අතර ග්‍රීක සම්භාව්‍ය යුගයේ කලා ලක්ෂණ සහිත නිර්මාණයකි.

22. ඉසුරුමුණිය විහාරයේ පොකුණ හා සම්බන්ධ පර්වත බිත්තියේ කැටයම් කර ඇති මිනිසා සහ අශ්ව හිස කැටයමේ මිනිස් රුවින් ............................................................ සංකේතවත් කරන බව පරණවිතාන මහතාගේ මතයයි.

23. මහනුවර දඹුළු විහාරයේ සිතුවම් නිර්මාණය කිරීමේ ගෞරවය හිමිවන්නේ ............................................................සිත්තර පරම්පරාවටය.

24. ලියනාඩෝ ඩාවින්චි විසින් සිතුවම් කළ මොනාලිසා සිතුවම පොප්ලර් නැමති ලීයක ............................................................ මාධ්‍ය භාවිතයෙන් නිර්මාණය කර ඇත.

25. ඩේවිඩ් ජේන්ටර් විසින් සිතුවම් කර ඇති ජයග්‍රාහී ලෙස ජෙරුසෙලමට ඇතුළුවීම නම් සිතුවම දැනට ................................ ................................................................................................ ප්‍රදර්ශනය කර ඇත.

- **ප්‍රශ්න අංක 26 සිට 30 දක්වා ප්‍රශ්නවලට නිවැරදි පිළිතුරු F, G, H, I, J යන රූප සටහන් ඇසුරින් ලියන්න.**



F



G



H



I



J

26. F අක්ෂරයෙන් දැක්වෙන්නේ හෙන්රි මුවර් ශිල්පියාගේ මූර්තියකි. එය නිර්මාණය කර ඇති මාධ්‍ය කුමක් ද? ................................................................................................................

27. G අක්ෂරයෙන් දැක්වෙන සන්නිදර්ශන චිත්‍රය සිතුවම් කළ ශිල්පියා නම් කරන්න. ............................................................

28. H අක්ෂරයෙන් දැක්වෙන ප්‍රසිද්ධ කාටූන් චරිතය හඳුන්වන නම කුමක් ද? ............................................................

29. I අක්ෂරයෙන් දැක්වෙන්නේ දමිළ ජාතික ශිල්පියෙකු වන කේ. කනකසබාපති ශිල්පියාගේ සිතුවමකි. එම නිර්මාණය සඳහා ආභාස කරගත් චිත්‍ර ශෛලිය කුමක් ද? ............................................................

30. J අක්ෂරයෙන් දැක්වෙන්නේ රෆායල් සන්සියෝගේ සිතුවමකි. එය හඳුන්වන නම කුමක් ද? ................................................................................................

| ප්‍රශ්න අංක 31 සිට 35 දක්වා දී ඇති වචන පැහැදිලි වන සේ සම්පූර්ණ වාක්‍ය තනන්න.

31. ටෙම්පරා ..........................................................................................

32. කියරොස්කුරෝ ..........................................................................................

33. මඩොල් කුරුපාව ..........................................................................................

34. පට්ටල් වැඩ ..........................................................................................

35. හයිරොග්ලිපික්ස් ..........................................................................................

| ප්‍රශ්න අංක 36 සිට 40 දක්වා දී ඇති ශීර්ෂ යටතේ මෙම කලා කෘතිය කලාත්මක ඇගයීමකට ලක් කරන්න.



36. හඳුනාගත් බව ..........................................................................................

37. ශිල්පියා ..........................................................................................

38. තේමාව ..........................................................................................

39. කලා ආභාශය ..........................................................................................

40. හැඟීම් ප්‍රකාශනය ..........................................................................................

සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## අර්ධ වාර්ෂික පරීක්ෂණය - 2019

## 11 ශ්‍රේණිය

## චිත්‍ර කලාව - III

**කාලය : පැය 02 යි.**

---

I ''අ'' ''ආ'' සහ ''ඇ'' යන කොටස් තුනෙන් ඔබ කැමති එක් මාතෘකාවක් තෝරාගෙන එක් චිත්‍රයක් පමණක් ඇඳ වර්ණ කරන්න.

''අ'' කොටස - චිත්‍ර සංරචන

1. බෝධි පූජාවක යෙදෙන බැතිමතුන්
2. ජන ක්‍රීඩාවක සිත්ගත් අවස්ථාවක්
3. දිය නාන අලි රංචුවක්

''ආ'' කොටස - මෝස්තර

4. නිර්මාණාත්මක සත්ත්ව රූප ඇසුරින් ගවුම් රෙද්දක් සඳහා සුදුසු ව්‍යාප්ත මෝස්තරයක් ඇඳ වර්ණ කරන්න. (අඟල් 9 5 9 ප්‍රමාණයේ කොටුවක් භාවිත කරන්න.)

5. ආයත චතුරස්‍රාකාර මේස රෙද්දක් සඳහා සුදුසු මුළුතල මෝස්තරයක් ඇඳ වර්ණ කරන්න.

6. මල් සහ කොළ යොදා ඔසරි පල්ලුවක් සඳහා සුදුසු මෝස්තරයක් ඇඳ වර්ණ කරන්න.

''ඇ'' කොටස - ග්‍රැෆික් චිත්‍ර

7. ''අපි එක මවකගෙ දරුවෝ'' යන තේමාව යටතේ පෝස්ටර් චිත්‍රයක් නිර්මාණය කරන්න.

8. පලතුරු බීම බෝතලයක් සඳහා සුදුසු ලේබල් එකක් නිර්මාණය කර වර්ණ කරන්න.

9. ''සංස්කෘතික උරුමයන්'' යන තේමාව යටතේ පොත් පිට කවරයක් නිර්මාණය කරන්න.

සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## අර්ධ වාර්ෂික පරීක්ෂණය - 2019

## 11 ශ්‍රේණිය

## චිත්‍ර කලාව - II

**කාලය : පැය 02 යි.**

---

**I නිදහස් රේඛාමය ඇඳීම හා වර්ණ චිත්‍ර සම්පිණ්ඩනය**

I ඔබ ඉදිරියේ ඇති ද්‍රව්‍ය සමූහය හොඳින් නිරීක්ෂණය කරන්න.

(1) රේඛා මගින් පූර්ව අධ්‍යයනයක යෙදෙන්න.

(2) ද්‍රව්‍ය සමූහය ඔබට පෙනෙන අයුරින් ඇඳ වර්ණ කරන්න.

මෙම චිත්‍ර දෙකම එකට අමුණා නම/විභාග අංකය සහ පන්තිය පසු පිටෙහි සඳහන් කොට, විභාග ශාලාධිපතිට භාර දෙන්න.

ඔබේ චිත්‍රය ඇගයීමේ දී පහත කරුණු කෙරෙහි සැලකිලිමත් වේ.

රේඛා අධ්‍යයනය

| | | |
|---|---|---|
| (1) | රේඛා මගින් කරන ලද පූර්ව අධ්‍යයනයේ දී දක්වා ඇති කුසලතා වර්ණ චිත්‍රය | (ලකුණු 05) |
| (2) | ද්‍රව්‍ය සමූහය කාලය මත කලාත්මකව සම්පිණ්ඩනය කිරීම | (ලකුණු 05) |
| (3) | පරිමාණ, පර්යාවලෝකන රීති හා ත්‍රිමාණ ලකුණු පිළිබඳ අවබෝධය | (ලකුණු 05) |
| (4) | දෙන ලද ද්‍රව්‍යවල ස්වභාවය හා ගති ලක්ෂණ දැක්වීම | (ලකුණු 05) |
| (5) | වර්ණ හැසිරවීමේ ශිල්පීය කුසලතා | (ලකුණු 05) |
| (6) | උචිත පසුබිමක් යෙදීම හා සමස්ත නිමාව | (ලකුණු 05) |
| | | මුළු ලකුණු 30 |

සැ: යු: ද්‍රව්‍ය සමූහය තබා ඇති ලෑල්ල විශාල ලෙස ඇඳීම අවශ්‍ය නොවේ. ලෑල්ලේ පරිමාණය ද්‍රව්‍ය සමූහයට ගැළපෙන අයුරින් වෙනස් කර ඇඳීමට ඔබට අවසර ඇත.

සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved


# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## අර්ධ වාර්ෂික පරීක්ෂණය - 2019

## 11 ශ්‍රේණිය

## චිත්‍ර කලාව - II

කාලය : පැය 02 යි.



- සුදු කඩදාසියකින් ආවරණය කළ පෙට්ටියක් (ඝනකාභයක හැඩය)
- කුඩා මැටි කළයක්
- වර්ණවත් රෙදි කැබැල්ලක්
- පැපොල් ගෙඩියක්
- මල් සහිත අරලිය අත්තක් (කොළ පහක් පමණ)

ඇස් මට්ටමින් පහළ සිටින සේ ආධාරකයක් මත තබන්න.

**Answer**

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## අර්ධ වාර්ෂික පරීක්ෂණය - 2019

## 11 ශ්‍රේණිය
## චිත්‍ර කලාව - පිළිතුරු පත්‍රය

### I කොටස

(1) ගණදෙවියන්/ගනේෂ්/ගණපති
(2) ලෝකඩ මාධ්‍ය
(3) ලෝහ වාත්තු/වාත්තු
(4) රාජාසන ලීලාවෙන්
(5) 12 වන සියවස
(6) ඒ.මාර්ක්
(7) ආනන්ද කුමරස්වාමි
(8) සුදු හුණු ගල්
(9) භූමි ස්පර්ශ මුද්‍රාව
(10) මහා ස්පින්ක්ස්/ස්පින්ක්ස්
(11) (iii)
(12) (i)
(13) (i)
(14) (ii)
(15) (ii)
(16) C
(17) D
(18) B
(19) E
(20) A
(21) ඇලෙක්සැන්ඩ්‍රෝස්
(22) වැස්සට අධිපති පර්ජන්‍ය
(23) නීලගම සිත්තර පරම්පරාවට
(24) තෙල් සායම්
(25) ජාතික කලාභවනේ
(26) ලෝකඩ
(27) සුමන දිසානායක
(28) ගජමෑන්
(29) සනිකවාදී ශෛලිය
(30) මැඩෝනා ඩෙලා සේදියා

(31) වියළි බදාමය මත බන්දන මාධ්‍යයක් (මැලියම්) සමඟ මිශ්‍ර කර ගන්නා ලද වර්ණවලින් ඇඳීමේ ක්‍රමය
(32) අඳුර තුළින් ආලෝකය වඩාත් තීව්‍ර ලෙස මතු කිරීම
(33) පරාල 26ක් එක් ලී ඇණයකට සම්බන්ධ කර නිර්මාණය කර ඇති ඇම්බැක්ක දේවාලයේ ඇති ගෘහ නිර්මාණ අංගය
(34) ලාක්ෂා කර්මාන්තයේ දී පට්ටලයක් ආධාරයෙන් වර්ණ ගැන්වීම/ලාක්ෂා මගින් සැරසිලි යොදන ශිල්ප ක්‍රමයකි.
(35) මිසර සිතුවම්වල පසුබිමට යොදා ඇති රූපාක්ෂර/කුරුළු දඩයම් චිත්‍රයේ පසුබිමට යොදාගෙන ඇත.
(36) කුඹල් හල නමැති සිතුවම
(37) ස්ටැන්ලි අබේසිංහ
(38) මැටි භාජන විකුණුම් හලක් සහ යුවලක් මින් නිරූපිතය
(39) සාම්ප්‍රදායික කලාවේ ශෛලිගත හැඩ/පශ්චාත් උපස්ථිතවාද් හා ප්‍රකාශනවාදී කලාවේ වර්ණ භාවිතය/සණිකවාදී කලාවේ ලක්ෂණ
(40) යොදාගත් අඳුරු වර්ණ මාලාවෙන් මුහුණේ හැඟීම් භාවාත්මක ප්‍රකාශනය කර ඇත. /අඳුරු හා ආලෝකමත් වර්ණ විසංගතව යෙදීමෙන් මිනිස් හැඟීම් වඩාත් තීව්‍ර ලෙස දැක්වීමට ශිල්පියා සමත්ව ඇත. /කුඹල් හලක යුවලකගේ ගති ස්වභාවයන් භාවාත්මක ප්‍රකාශනය කර ඇත.